මහාචාර්ය නීලිකා මලවිගේ විසින්, කොවිඩ්-19 වසංගතය අතරතුර පාසල් විවෘත කිරීම සම්බන්ධයෙන් සිදුකළේ යැයි කියන ප්‍රකාශයක් පිළිබඳව සමාජ මාධ්‍ය තුළ අවධානය යොමුවී තිබිණි. මෙහිදී ඉරිදා මව්බිම මෙය වාර්තා කර තිබුණේ, "බටහිර රටවල ආසාදිතයන් වැඩි වුණත් ඔවුන්ගේ පාසල් විවෘතයි" යන සිරස්තලයෙනි. නමුත් ලංකාදීප පුවත්පත මෙය වාර්තා කර තිබුණේ "පාසල් අරින්න තවත් බලාගෙන ඉන්න එපා -මහාචාර්ය නීලිකා මලවිගේ" යන සිරස්තලය සමගිනි.

මේ අතර, මහාචාර්යවරිය විසින් සිය ෆේස්බුක් ගිණුමේ සටහනක් තබමින් කියා සිටින්නේ, ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය තමන්ව වරදවා උපුර්ටා දක්වන බවයි. එසේම තමන් කියූ දෙයක කොටසක් පමණක් සන්දර්භයෙන් පිටතට ගෙන සඳහන් කරනා බවටයි.

මහාචාර්යවරිය මෙම ප්‍රකාශය සිදුකළේ යැයි කියන, ගේට්වේ විදුහල විසින් මහාචාර්යවරිය හා කළ සාකච්ඡාවේදී ඇය විසින් එවැනි ප්‍රකාශයක් ඍජුව සිදුනොකරන බවත්, "පාසැල් නැවත විවෘත කිරීම ප්‍රමාද කළ නොහැකියි" යනුවෙන් යුනිසෙෆ් විධායක අධ්‍යක්ෂ විසින් කළ ප්‍රකාශයක් උපුටා දැක්වීම පමණක් සිදුකරන බවත් නිරීක්ෂණය කළ හැක.

ඒ අනුව අපට නිරීක්ෂණය කළ හැක්කේ ලංකාදීප පුවත්පත මගින් මහාචාර්ය නීලිකා මලවිගේව සාවද්‍ය ලෙසින් උපුටා දක්වන බවයි. මෙය මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් බැව් නොකිවමනායි. එසේ නම් ලංකාදීප පුවත්පත නිවැරදි කිරීමක් පළ කිරීමට සහ කණගාටුව ප්‍රකාශ කිරීමට උත්සුක නොවන්නේද? අඩු තරමින් මීලඟට ගත යුතු ආචාර ධාර්මික පියවර එය නොවේද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

මූලාශ්‍ර:
https://www.youtube.com/watch?v=op1tCk73qzc
**https://www.facebook.com/36805864/posts/10103568570338599/**

**#MediaEthicsSL #lka #sinhalanews #SundayMawbima #Lankadeepa**